# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 55 දරන ශ්‍රී ලංකා

# මූලික අධ්‍යයන ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.10 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

## 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 35/80.

**මූලික අධ්‍යයනය සඳහා ආයතනයක් ශ්‍රී ලංකාවෙහි පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. **ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

### I වන කොටස

### ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය

2. (1) ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. **ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය සංස්ථාගත කිරීම.**

(2) ආයතනය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් බවට පත් විය යුතු ය. එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර එම නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. මූලික හා උසස් අධ්‍යයනය සඳහා උනන්දුවක් ඇති කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම ආයතනයේ අරමුණු සහ පරමාර්ථ විය යුතු අතර විශේෂයෙන් ම— **ආයතනයේ අරමුණු සහ පරමාර්ථ.**

(අ) ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, සමාජ විද්‍යා සහ දර්ශනය යන විෂයයන් කෙරෙහි විශේෂ අවධානයක් ඇතිව, සාමාන්‍ය වශයෙන් මූලික අධ්‍යයන පිළිබඳව පර්යේෂණ සහ මුල් විමර්ශන ආරම්භ කිරීම, වැඩි දියුණු කිරීම සහ පැවැත්ම ද ;

(ආ) ආයතනයේ ශාස්ත්‍රීය වැඩ කටයුතු ඉදිරියට ගෙන යනු පිණිස සහ විද්‍යා දැනුම ව්‍යාප්ත කරනු පිණිස දේශන, රැස්වීම්, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සමුළු, සංවිධාන කිරීම ද ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත සහ විදේශවල නිර්මාණාත්මක කාර්ය යන්හි නිරතව සිටින විද්‍යාඥයින්ට දේශන පැවැත්වීමට සහ ආයතනයේ කටයුතුවලට සහභාගිවීමට ඇරයුම් කිරීම ද ;

2—57722—12,925 (81/09)

(ඈ) වෙනත් රටවල විද්‍යා කටයුතුවල නියුක්ත තැනැත්තන් සහ විද්‍යා ආයතන සමග සබඳතා ඇති කර ගැනීම සහ පවත්වා ගෙන යාම ද ආයතනයේ අරමුණු සහ පරමාර්ථවලට අදාල කරුණු සම්බන්ධයෙන් අන්තර් ජාතික සහයෝගිතාව ඇති කිරීම ද ;

(ඉ) ආයතනයේ අරමුණු හා පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් ක්‍රියා හා දේ කිරීම ද

එකී අරමුණු සහ පරමාර්ථ විය යුතු ය.

ආයතනයේ බලතල.

4. ස්වකීය අරමුණු සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ ලා අවශ්‍ය වන බලතල සහ අයිතිවාසිකම් ආයතනයට තිබිය යුතු අතර, එය විසින් විශේෂයෙන් ම—

(අ) ආයතනයේ කටයුතු කළමනාකරණය පිළිබඳව රීති සෑදීම ද ;

(ආ) මූලික සහ උසස් අධ්‍යාපනයන් සඳහා මහාචාර්ය පදවි, සාමාජිකත්ව සහ පර්යේෂණ අධි සාමාජිකත්ව ස්ථාපනය කිරීම සහ තෑගි සහ පදක්කම් පිරිනැමීම ද ;

(ඇ) මූලික සහ උසස් අධ්‍යයනයන් සඳහා පුස්තකාල සහ විද්‍යාගාර ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යෑම සහ වෙනත් සේවා සැලසීම ද ;

(ඈ) මිල දී ගැනීමෙන්, ප්‍රදානයක් වශයෙන්, ත්‍යාගයක් වශයෙන්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ අන්‍යාකාරයකින් ආයතනය වෙත පැවරෙන කවර හෝ චංචල හෝ නිශ්චල දේපලක් භාර ගැනීම සහ දැරීම ද, ආයතනයේ රීතිවලට යටත්ව, ඒ දේපල විකිණීම, පවරාදීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ද ;

(ඉ) මූලික හා උසස් අධ්‍යාපනයන් සඳහා දිරිගැන්වීමට පර්යේෂණ අරමුදලක් පිහිටුවීම ද ;

(ඊ) ආයතනයේ පරමාර්ථවලට මුළුමනින් ම හෝ අර්ධ වශයෙන් හෝ සමාන පරමාර්ථ ඇති සහ ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක පිහිටි අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමග පුද්ගලයන් සහ ශිෂ්‍යයන් හුවමාරු කර ගැනීම සඳහා සහ සාමාන්‍ය යෙන් ඔවුන්ගේ පොදු පරමාර්ථවලට හිතකර වන කාර්ය සඳහා සහයෝගිතා ගිවිසුම්වලට ඇතුළත් වීම ද ;

(උ) ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම් කිරීම ද ;

(ඌ) පහසුවෙන් ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස හා එහි කර්තව්‍ය කර ගෙන යාම පිණිස ආයතනයේ මතය අනුව අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් ද

කළ හැකි ය.

## II වන කොටස

### ආයතනයේ බලධරයෝ

5. පාලක මණ්ඩලය සහ ශාස්ත්‍රීය සභාව ආයතනයේ බලධරයෝ වන්නාහ. ආයතනයේ බලධරයෝ.

6. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන පාලක මණ්ඩලයක් මගින් ආයතනය පාලනය කරනු ලැබිය යුතු ය :— පාලක මණ්ඩලය.

(i) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා; ඔහු මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය ;

(ii) අග්‍රාමාත්‍යවරයා ;

(iii) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ;

(iv) ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(v) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(vi) ශාස්ත්‍රීය සභාව විසින් එහි සාමාජිකයන් අතුරින් තෝරා පත් කරනු ලබන තැනැත්තන් තුන් දෙනෙක් ; ඒ එක් එක් තැනැත්තා තුන් වර්ෂයක් ගතවීම හෝ ඔහු ශාස්ත්‍රීය සභාවේ සාමාජිකයකු වීම අවසන් වීම යන දින දෙකින් කලින් එළඹෙන දිනය දක්වා ධුරය දැරිය යුතු ය ; තවද

(vii) ජනාධිපතිවරයාගේ මතය අනුව, ආයතනයේ වැඩවලට අදාළ විශේෂ සුදුසුකම් දරන තැනැත්තන් අතුරෙන් ජනාධිපතිවරයා විසින් තුන් වර්ෂයක කාලයක් සඳහා පත් කරනු ලබන වෙනත් තැනැත්තන් හතර දෙනෙක්.

(2) (1) (vi) වන උපවගන්තිය යටතේ තෝරා පත් කරන ලද සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම, ශාස්ත්‍රීය සභාවේ ධුරය අවසන් වීම හෝ එයින් ඉවත් කිරීම මගින් ධුරය හිස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන පුරප්පාඩුවක්, ශාස්ත්‍රීය සභාව විසින් එහි සාමාජිකයකු තෝරා පත් කිරීමෙන් පුරවනු ලැබිය යුතු අතර එසේ තෝරා පත් කරනු ලැබූ තැනැත්තා විසින් ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම මගින් ඇති වූ පුරප්පාඩුවක් ජනාධිපතිවරයා විසින් පුරවනු ලැබිය යුතු ය. පුරප්පාඩුවක් පිරවීම සඳහා එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(4) (1) (vi) වන උපවගන්තිය යටතේ ශාස්ත්‍රීය සභාව විසින් තෝරා පත් කරන ලද හෝ (1) (vii) වන උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ හෝ සාමාජිකයකු විසින්, කවර වූ හෝ අවස්ථාවක, ජනාධිපතිවරයා ආමන්ත්‍රිත ලිපියක් මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම පිළිගනු ලැබූ බව, ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙත ලිය විල්ලකින් දන්වා යවන තුරු ඒ ඉල්ලා අස්වීම බලාත්මක නොවිය යුතු ය.

(5) (1) (vi) වන උපවගන්තිය යටතේ ශාස්ත්‍රීය සභාව විසින් තෝරා පත් කරන ලද හෝ (1) (vii) වන උපවගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකුට, අසනීපවීම, බෙලහීනතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වී සිටීම හේතු කොට ගෙන, මාස තුනකට නොඅඩු කාලයක්, සිය ධුරයේ කටයුතු කිරීමට තාව කාලික වශයෙන් නොහැකිවන අවස්ථාවක, ජනාධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දීම ඒ සාමාජිකයාගේ යුතුකම විය යුතු ය. ජනාධිපතිවරයා විසින්, (1) (vii) වන උපවගන්තියේ විධිවිධාන පිළිබඳව සැලකිල්ලක් දක්වමින් ඔහුගේ ස්ථානයේ වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) ජනාධිපතිවරයා විසින් මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු හේතු දක්වීමක් නොමැතිව ජනාධිපතිවරයා විසින් ඕනෑම අවස්ථාවක, ඉවත් කරනු ලැබිය හැකි අතර එම ඉවත් කිරීම පිළිබඳව කවර හෝ අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

**මණ්ඩලයේ කටයුතු.**

7. (1) සභාපතිවරයා විසින් හෝ ඔහු නොමැති විටක, අග්‍රාමාත්‍ය වරයා විසින් හෝ ඒ දෙදෙනාම නොමැති විටක, විරුද්ධ පක්ෂයේ නායකයා විසින් හෝ ඒ තිදෙනාම නොමැති විටක, මණ්ඩලයේ යම් රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු විසින් හෝ ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(2) අවශ්‍ය යයි මණ්ඩලය සලකන කවර හෝ අවස්ථාවක, මණ්ඩලය රැස්විය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(4) මණ්ඩලයේ කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය සඳහා මේ පනතේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

(5) මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල ලෙස නොසැලකිය යුතු ය.

(6) අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන තැනැත්තන් විමසා, ජනාධිපතිවරයා තීරණය කරන දීමනා සහ වෙනත් පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

**ආයතනයේ ලේකම්වරයා.**

8. (1) මණ්ඩලය විසින් ආයතනයට ලේකම්වරයකු පත් කළ යුතු ය. මණ්ඩලය විසින් ලේකම්වරයාගේ බලතල, කර්තව්‍ය සහ කාර්ය මේ පනතේ විධිවිධානවලට හා ආයතනයේ රීතිවලට යටත්ව නිශ්චය කළ යුතු ය.

(2) මණ්ඩලයේ ලේඛන සහ ආයතනයේ දේපළ පිළිබඳ භාර කාරත්වය සම්බන්ධයෙන් ලේකම්වරයා වගකිව යුතු ය.

(3) ලේකම්වරයා නිල බලයෙන් මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය.

(4) මණ්ඩලයේ සභාපතිවරයාගේ විධානයට හා පාලනයට යටත් ව ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සහ ශාස්ත්‍රීය නොවන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් ලේකම්වරයා වගකිව යුතු ය.

9. මේ පනතේ විධිවිධානවලට සහ ආයතනයේ රීතිවලට යටත්ව, ආයතනයේ පහත දැක්වෙන බලතල සහ කාර්ය, පාලක මණ්ඩලය වෙත පැවරෙන්නේ ය :— ආයතනයේ බලතල සහ කාර්ය පාලක මණ්ඩලය වෙත පැවරෙන බව.

(අ) ආයතනයේ දේපළ සහ අරමුදල් සතුව ඩිවීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ආ) ආයතනය සඳහා නිල ලාංඡනයක් තෝරා ගැනීම සහ ආයතනයේ ආකෘති තීරණය කිරීම, ආයතනයේ පොදු මුද්‍රාවෙහි භාරකාරත්වය සඳහා විධිවිධාන සැලැස්වීම සහ එහි භාවිතය මෙහෙයවීම ;

(ඇ) ආයතනයට සම්බන්ධ සියලු කරුණු මේ පනතට හා ආයතනයේ රීතිවලට අනුකූලව විධිමත් කිරීම හා තීරණය කිරීම ;

(ඈ) ශාස්ත්‍රීය සභාවේ නිර්දේශ සලකා බැලීමෙන් පසුව—

(i) මහාචාර්ය ධුර, සාමාජිකත්ව සහ අධි සාමාජිකත්ව ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම ; සහ

(ii) ඒ තනතුරුවලට පත්කිරීම සඳහා නියමිත සුදුසුකම් තීරණය කිරීම හා ඒ තනතුරු දරන්නන්ට ගෙවිය යුතු පඩිනඩි තීරණය කිරීම ;

(ඉ) නිශ්චිත කාර්ය සඳහා වියදම් කිරීමට ආයතනයට ඇති මුදල් පරිපාලනය කිරීම ;

(ඊ) ආයතනයට යම් දේපළක් රික්ථවරණය කළ විට, පරිත්‍යාග කළ විට සහ ප්‍රදානය කල විට එය භාරගැනීම සහ පිළිගැනීම ;

(උ) ආයතනයේ වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම් සහ මුදල් ඇස්තමේන්තු සලකා බැලීම සහ ඒ වාර්තාව, ගිණුම් සහ ඇස්තමේන්තු, ගැසට් පත්‍රයෙහි පළ කිරීම ;

(ඌ) ආයතනයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, භූමිභාග, ලී බඩු, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සැපයීම ; සහ

(එ) ආයතනය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත් වීම, ගිවිසුම් ක්‍රියාත්මක කිරීම, ගිවිසුම් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සහ ප්‍රයෝජනයට නොයොදා ඇති යම් ආදායමක් ද ඇතුළුව, ආයතනයට අයත් මුදල්, භාර ආඥාපනතේ 20 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන යටතේ හෝ භාරකාර මුදල්

නිත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම, හෝ ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එකී යම් මුදලක් ආයෝජනය කිරීම හෝ ඒ ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම් සඳහා වහාම අවශ්‍ය නොවන යම් කොටසක්, යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම :

එසේ වුව ද යම් ශාස්ත්‍රීය කරුණක් සම්බන්ධයෙන් වූ යම් යෝජනාවක් පිළිබඳව ශාස්ත්‍රීය සභාවේ නිර්දේශය වාර්තා කොට, මණ්ඩලය වෙත යැවීමට අවස්ථාවක් ශාස්ත්‍රීය සභාවට පළමුව ලැබී තිබේ නම් මිස, ඒ යෝජනාව මණ්ඩලය විසින් සම්මත නොකළ යුතු ය.

මේ වගන්තියෙහි "ශාස්ත්‍රීය කරුණක්" යන්නෙන්, ශාස්ත්‍රීය සභාවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් කවර හෝ කරුණක් අදහස් වේ.

ශාස්ත්‍රීය සභාව.

10. (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ ශාස්ත්‍රීය සභාව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) ආයතනයේ අධ්‍යක්ෂවරයා (නිල බලයෙන්) සභාපතිවරයා විය යුතු ය ;

(ආ) ආශ්‍රිත අධ්‍යක්ෂවරයන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් පත් කරනු ලැබ තිබේ නම්, එම අධ්‍යක්ෂවරයෝ (නිල බලයෙන්) ;

(ඇ) ආයතනයේ ස්ථිර මහාචාර්යවරයෝ ;

(ඈ) ආයතනයේ ස්ථිර සාමාජිකයෝ ;

(ඉ) ආයතනයේ පර්යේෂණ අධි සාමාජිකයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ඊ) එක් විශ්ව විද්‍යාලයකින් දෙදෙනකුට වැඩි නොවන සේ, ශ්‍රී ලංකාවේ එක් එක් විශ්ව විද්‍යාලයේ මණ්ඩලය විසින් නම් කරනු ලබන නියෝජිතයන්.

(2) අවශ්‍ය කවර හෝ අවස්ථාවක ද වර්ෂයකට යටත් පිරිසෙයින් දසවතාවක් ද සභාව රැස්විය යුතු ය.

(3) සභාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සඳහා මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

සභාවේ බලතල හා කාර්යයන්.

11. මේ පනතේ විධිවිධානවලට සහ ආයතනයේ රීතිවලට යටත්ව, ශාස්ත්‍රීය සභාව විසින්—

(අ) ආයතනයේ උපදෙස් දීම, අධ්‍යාපන, පර්යේෂණ හා පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පාලනය කිරීම හා මෙහෙයවීම ;

(ආ) 6 (1) (vi) වන වගන්තියේ සඳහන් සාමාජිකයන් තිදෙනා මණ්ඩලයට තෝරා පත් කරනු ලැබිය යුතු අතර සභාව විසින් සුදුසු යයි අදහස් කරනු ලබන්නේ නම්, කවර වූ හෝ අවස්ථාවක, ඔවුන් සියලු දෙනම හෝ ඔවුන්ගෙන් කවරකු හෝ ඉවත් කිරීම නිර්දේශ කිරීම;

(ඇ) ආයතනයේ අධ්‍යක්ෂවරයා, ආශ්‍රිත අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන්, මහාචාර්යවරයන්, බාහිර මහාචාර්යවරයන් සහ සාමාජිකයින් පත් කිරීම පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ඈ) අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වූ අවස්ථාවක අධ්‍යක්ෂවරයා පත් කිරීම පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම සහ ඔහු ඉවත් කිරීම අවශ්‍ය යයි සභාව සලකන්නේ නම් එසේ ඉවත් කරන ලෙස නිර්දේශ කිරීම ද;

(ඉ) සියලුම ශාස්ත්‍රීය කරුණු සහ ඒවාට සම්බන්ධ කරුණු පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම;

(ඊ) ආයතනයේ අධ්‍යයන අංශය සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් දීම; සහ

(උ) මේ පනතේ විධිවිධානවලට අනුව වෙනත් සියලු කරුණු පිළිබඳව සභාවේ නිර්දේශය විමසන ලද අවස්ථාවක, ඒ කරුණු පිළිබඳව නිර්දේශ කිරීම

කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### ආයතනයේ අංශ සහ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය

12. ශාස්ත්‍රීය සභාවේ උපදෙස් අනුව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන, (මෙහි මින්මතු, "අංශ" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යයන අංශවලින් ආයතනය සංයුක්ත විය යුතු ය. ආයතනයේ අංශ.

13. එක් එක් අංශයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය මෙහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :— අංශවල ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය.

(අ) මහාචාර්යවරු,

(ආ) සාමාජිකයෝ,

(ඇ) පර්යේෂණ අධි සාමාජිකයෝ.

14. තමාගේ වෙනත් කාර්යන්ට අතිරේකව අධ්‍යක්ෂවරයා විසින් අංශයක මහාචාර්යවරයා ලෙස ද කටයුතු කළ හැකි ය. අධ්‍යක්ෂවරයා විසින් මහාචාර්යවරයා ලෙස කටයුතු කළ හැකි බව.

ආයතනයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය.

15. ආයතනයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂවරයා ගෙන් ද සියලුම අංශවල මහාචාර්යවරයන්, සාමාජිකයන් සහ පර්යේෂණ අධි සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුතු ය.

මහාචාර්ය වරයන්ගේ ගණ.

16. මහාචාර්යවරයන් ගණ දෙකකට අයත් වන්නාහ ; එනම් :—

(අ) ස්ථිර මහාචාර්යවරයෝ ; සහ

(ආ) බාහිර මහාචාර්යවරයෝ.

සාමාජික ගණ ආදිය.

17. සාමාජිකයන් ගණ හතරකට අයත් වන අතර මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට ඔවුන් පත් කරනු ලැබීම හෝ ඇතුළත් කරගනු ලැබීම හෝ කළ යුතු ය :—

(අ) ආයතනයේ ස්ථිර ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත් කරනු ලබන ස්ථිර සාමාජිකයෝ ;

(ආ) ආයතනයේ බාහිර ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ සාමාජික යන් වශයෙන් පත් කරනු ලබන බාහිර සාමාජිකයෝ ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ආයතනවලට අයත් තැනැත්තන් වන්නා වූ සහ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන්නා වූ ආශ්‍රිත සාමාජිකයෝ ; සහ

(ඈ) ආයතනයේ තාවකාලික ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන්නා වූ තැනැත්තන් වන තාවකාලික සාමාජිකයෝ.

පර්යේෂණ අධි සාමාජික ගණ ආදිය.

18. පර්යේෂණ අධි සාමාජිකයන් ගණ දෙකකට අයත් වන්නාහ ; එනම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ අධි සාමාජිකයෝ ; සහ

(ආ) කණිෂ්ඨ පර්යේෂණ අධි සාමාජිකයෝ.

## IV වන කොටස

## ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය සහ වෙනත් කාර්ය මණ්ඩල පත්කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සහ වෙනත් කරුණු

අධ්‍යක්ෂවරයන්, ආශ්‍රිත අධ්‍යක්ෂවරයන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් පත් කිරීම.

19. (1) ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. ඉන් පසුව කෙරෙන එවැනි පත්වීම් ශාස්ත්‍රීය සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගැනීමෙන් පසුව මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු ය. ශාස්ත්‍රීය සභාවේ තීරණයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔහු වග කිවයුතු අතර මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලබන වෙනත් කර්තව්‍යයන් ද ඔහු ඉටු කළ යුතු ය.

(3) ආශ්‍රිත අධ්‍යක්ෂවරයන් හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සිටින්නේ නම්, ඔවුන්, ශාස්ත්‍රීය සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගැනීමෙන් පසුව මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

20. (1) ශාස්ත්‍රීය සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගැනීමෙන් පසුව, මණ්ඩලය විසින් මහාචාර්යවරයන් සහ සාමාජිකයන් පත් කිරීම කළ යුතු ය. මහාචාර්ය වරයන්, සාමාජිකයන් හා පර්යේෂණ අධි සාමාජික යන් පත් කිරීම හා ඔවුන්ට අදාළ රීති.

(2) අධ්‍යක්ෂවරයා විසින් මහාචාර්යවරයා හෝ අදාළ අංශයේ ප්‍රධානියා හෝ විමසා, පර්යේෂණ අධි සාමාජිකයන් පත් කළ හැකි ය. එවැනි සියලු පත්කිරීම් පිළිබඳව මණ්ඩලයට වාර්තා කළ යුතු ය.

(3) මණ්ඩලය විසින්, ආයතනයේ අධ්‍යක්ෂවරයන්ගේ, ආශ්‍රිත අධ්‍යක්ෂවරයන්ගේ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන්ගේ, මහාචාර්ය වරයන්ගේ, සාමාජිකයන්ගේ සහ පර්යේෂණ අධි සාමාජිකයන්ගේ වරප්‍රසාද නිශ්චය කරන රීති සාදනු ලැබිය හැකි ය.

21. අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලැබිය හැකි පරිදි, වෙනත් යම් නිලධරයන් සහ සේවකයන්, මණ්ඩලය විසින් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කළ හැකි ය. මණ්ඩලය විසින් වෙනත් කාර්ය මණ්ඩල පත් කළ හැකි බව.

22. මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත් ව, මණ්ඩලය විසින්— ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය ද ඇතුළුව සියලු කාර්ය මණ්ඩල පිළිබඳ විනය පාලනය, මණ්ඩලය විසින් කළ හැකි බව.

(අ) ආයතනයේ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය ඇතුළුව කාර්ය මණ්ඩලය පත කිරීම සහ ඒ කාර්ය මණ්ඩලය පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ පඩි හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමිකයන් නියම කිරීම ; සහ

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ නියම හා කොන්දේසි තීරණය කිරීම

කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු, බරපතල ලෙස රාජකාරි පැහැර හැරීම නිසා හෝ චරිත දූෂණය නිසා හෝ ලිඛිතව වාර්තාගත කළ යුතු වෙනත් සුදුසු හා ප්‍රමාණවත් හේතු නිසා හෝ රැස්වීමක දී මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් වූ තීරණයකින් පමණක් මගින් මිස, සේවයෙන් පහ කළ නොහැකි ය.

23. 21 වන සහ 22 වන වගන්තිවල සඳහන් සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් හෝ සඳහා මේ පනත යටතේ රීති සෑදිය හැකි ය. 21 වන සහ 22 වන වගන්තිවල සඳහන් කරුණු සඳහා රීති සෑදිය හැකි බව.

**රජයේ සේවකයන් සහ පළාත් පාලන සේවයේ හෝ යම්** පළාත් පාලන ආයතනයක නිලධරයන් හා සේවකයන් ආයතනයේ **කාර්ය මණ්ඩලයට පත්** කිරීම.

**24.** (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලනය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව ඒ මණ්ඩලය විසින්, එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ, රජයේ සේවයේ යම් නිලධරයකු සම්බන්ධයෙන්, 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13(2) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, අදාළ විය යුතු අතර, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ රජයේ සේවයේ නිලධරයන් සම්බන්ධයෙන්, ඒ පනතේ 13(3) වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වන ගිවිසුමකට ආණ්ඩුව සමග එළඹ ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා මණ්ඩලය යටතේ සේවය කරන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා, ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සැලකිය යුතු ය.

(4) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථාවෝචිත පරිදි ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින්, එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ මණ්ඩලය සහ ඒ කොමිෂන් සභාව හෝ පළාත් පාලන ආයතනය එකඟ වන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ කොන්දේසි හා නියමයන් ද ඇතුළු නියමයන් හා කොන්දේසි මත, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට එවැනි කැමැත්ත ඇතිව, ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු හෝ පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු ඒ කාර්ය මණ්ඩලයේ සෙසු කවර හෝ සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුගේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය යටතේ වූ සේවා නියුක්තිය, ජනාධිපතිවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමතය ඇතිව මිස, අවසන් නො කළ යුතු ය.

## V වන කොටස

### මූලික අධ්‍යයන ආයතන අර්ථසාධක අරමුදල

**25.** (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "මූලික අධ්‍යයන ආයතන අර්ථසාධක අරමුදල" යනුවෙන් නම් කරනු ලබන හා හඳුන්වනු ලබන අරමුදලක් මණ්ඩලය විසින් පිහිටුවිය යුතු ය.

මූලික අධ්‍යයන ආයතන අර්ථසාධක අරමුදල.

**26.** අර්ථසාධක අරමුදල පාලනය කිරීම සඳහා ද පරිපාලනය කිරීම සඳහා ද කළමනාකරණය කිරීම සඳහා ද අර්ථසාධක අරමුදලට ආනුෂංගික හෝ සම්බන්ධ සියලු කරුණු සඳහා ද මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

අර්ථසාධක අරමුදල පාලනය කිරීම සඳහා රීති.

**27.** (1) ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සෑම මහාචාර්යවරයකුම, සාමාජිකයකුම, අධිසාමාජිකයකුම, නිලධරයකුම හා සේවකයකුම විසින්, තමා සේවයේ නියුක්ත කරනු ලැබූ දිනයෙහි සිට, තමාගේ ඉපයීම්වලින් සියයට දහයක ප්‍රමාණයකට සමාන මුදලක්, මාස් පතා තමාගේ වැටුපෙන් කරනු ලබන සමාන අඩු කිරීම් මගින්, අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ය; තවද, ඒ සමගම, ඊට අතිරේකව, ඒ සෑම දායකයකුගේ ම ඉපැයීම් වලින් සියයට පහළොවකට සමාන මුදලක් හෝ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයක මුදලක් ඒ දායකයා වෙනුවෙන් අරමුදලට දායක මුදල් වශයෙන් ආයතනය විසින් අරමුදලින්, ගෙවිය යුතු ය.

අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම.

(2) ලේකම්වරයා විසින් අරමුදල සඳහා පොදු ගිණුමක් ද අරමුදලේ එක් එක් දායකයා වෙනුවෙන් වෙනම ගිණුමක් ද විවෘත කොට, පවත්වා ගෙන යා යුතු ය. දායකයකු විසින් අර්ථ සාධක අරමුදලට ගෙවනු ලබන සියලු දායක මුදල් ද ඒ දායකයා වෙනුවෙන් ආයතනය විසින් අරමුදලට ගෙවනු ලබන සියලු දායක මුදල් ද ඒ දායකයා වෙනුවෙන් අරමුදලෙහි වෙනම වූ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(3) දායකයකුගේ ගිණුමෙහි බැරට ඇති මුදලට, ආයතනයේ රීති අනුව, ඒ දායකයා දායකයකුව සිටීම අවසන් වන දිනය තෙක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, මණ්ඩලය විසින් නියම කරනු ලබන අනුප්‍රමාණයක් අනුව වූ වැල් පොලියත්, තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදනු ලබන යම් රීතියක විධිවිධානවලට යටත්ව, එකතු විය යුතු ය. තව ද එකී දිනයෙහි දී ඒ දායකයාගේ ගිණුම අවසන් කළ යුතු ය. දායකයකුගේ බැරට එකතුවී ඇති මුදල, ගිණුම අවසන් කළ දිනයේ සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත ගෙවා නොමැති අවස්ථාවක, ඔහුගේ බැරට ඇති සම්පූර්ණ මුදල ගෙවනු ලබන මාසයට පෙර වූ මාසයේ අන්තිම දිනය දක්වා, මේ වගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි වූ අනුප්‍රමාණයට අනුව වූ පොලියක් ගෙවිය යුතු ය:

එසේ වුව ද, ඒ දායකයාට ඒ මුදල ගෙවීම ප්‍රමාදවීම දායකයාගේ යම් වරදක් නිසා සිදු වූ අවස්ථාවක, ඔහුගේ ගිණුම අවසන් කළ දිනයට පසු එකතු වූ පොලිය නොගෙවිය යුතු ය.

දායකයන්ට ආපසු මුදල් ගෙවීම.

28. (1) 27 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි යම් දායකයකුට ගෙවිය යුතු මුදල 29 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ලේකම්වරයා විසින් ඒ දායකයාට ගෙවිය යුතු ය.

(2) 27 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ දායකයකු වීම අවසාන වන දිනයට පෙර දායකයකු රෝගාතුරවීම නිසා හෝ අබලතාවට පත්වීම නිසා හෝ ඔහු සේවා නියුක්තව සිටි ධුරය අහෝසි කිරීම නිසා හෝ ආයතනය විසින් ඔහු සේවානියුක්ත කරනු ලැබීම අවසාන වුවහොත් හෝ ඔහු ආයතනයේ සේවයෙන් සිය කැමැත්තෙන් විශ්‍රාම ගතහොත්, අවස්ථාවෝචිත පරිදි, එසේ ඔහුගේ සේවා නියුක්තිය අවසන් වූ දිනයෙහි දී ඔහුගේ ගිණුමෙහි බැරට එකතු වී ඇති සම්පූර්ණ මුදල, ලේකම්වරයා විසින්, 29 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ දායකයාට ගෙවිය යුතු ය.

(3) දායකයකු එසේ දායකයකුව සිටීම 27 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අවසන් වන දිනයට පෙර, ඔහු ආයතනයේ සේවයෙන් පහ කරනු ලැබූ අවස්ථාවක, අර්ථ සාධක අරමුදලට ඒ දායකයා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය, ඒ දායකයා සේවයෙන් පහ කරන ලද දිනය තෙක් ඊට එකතුවී ඇති පොලියත් සමග ලේකම්වරයා විසින් 29 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ දායකයාට ගෙවිය යුතු ය.

(4) දායකයකු, ආයතනයේ සේවයේ යෙදී සිටින අතරතුර මිය ගිය අවස්ථාවක, ලේකම්වරයා විසින් අර්ථසාධක අරමුදලෙහි ඒ දායකයාගේ බැරට එකතු වී ඇති සම්පූර්ණ මුදල, මිය ගිය දායකයාගේ බූදලයට හෝ ඒ මුදලට නීත්‍යනුකූලව හිමිකම ඇති තැනැත්තාට හෝ 29 වගන්තියේ විධිවිධානවලට යටත්ව ගෙවිය යුතු ය.

අරමුදලින් කරනු ලබන අඩු කිරීම් ප්‍රථම වැය බරක් විය යුතු බව.

29. දායකයකු ආයතනයේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටි කාලය තුළ යම් අවස්ථාවක, ඔහුගේ වංකභාවය හෝ නොසැලකිල්ල හේතු කොට ගෙන, ඒ ආයතනයට දැරීමට සිදු වූ යම් පාඩුවක හෝ අලාභයක ප්‍රමාණය, මේ කොටසේ ඉහතින්ම වූ විධිවිධාන නොතකා සහ වෙනත් යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව, ඒ අර්ථසාධක අරමුදලෙහි ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති මුදලේ ප්‍රථම වැය බරක් විය යුතු ය; තව ද 28 වන වගන්තියේ විධිවිධාන අනුව යම් ගෙවීමක් කරනු ලබන අවස්ථාවේ ඒ මුදල අඩු කර ගනු ලැබිය හැකි ය.

අර්ථසාධක අරමුදලට අතිරේක වශයෙන් හෝ විකල්ප වශයෙන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල.

30. මේ කොටස යටතේ පිහිටුවනු ලැබූ අර්ථසාධක අරමුදලට විකල්ප වශයෙන් හෝ ඊට අමතරව, මණ්ඩලය විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවනු ලැබිය හැකි ය. ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය හා ඒ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පාලනය කිරීම, පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

ලේකම්වරයාගේ බලතල වෙනත් නිලධරයකුට පැවරීම.

31. මේ කොටස යටතේ වූ ලේකම්වරයාගේ බලතල හා කාර්ය, මණ්ඩලයේ කැමැත්ත ඇතිව, ආයතනයේ නිලධරයකුට පැවරිය හැකි ය.

## VI වන කොටස

### මුදල්

32. ආයතනයේ අරමුණු හා පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් වන වාර්ෂික ප්‍රදාන මුදලක් ආණ්ඩුව විසින් ආයතනයට ප්‍රදානය කළ හැකි ය. ආණ්ඩුවේ ප්‍රදාන මුදල.

33. ආයතනයේ අරමුණු හා පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවේ හෝ පිටරටක හෝ යම් ප්‍රභවයකින් ප්‍රදාන මුදල් ලබා ගැනීමට ද සංස්ථාගත කළ හෝ නොකළ යම් පුද්ගලයකු, ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ ඒ ප්‍රදාන මුදල් සම්බන්ධයෙන් කෙළින්ම අදහස් හුවමාරු කර ගැනීමට ද ආයතනයට හිමිකම් තිබිය යුතු ය. කවර හෝ ප්‍රභවයකින් ප්‍රදාන මුදල් ලබා ගැනීමට ආයතනයට හිමිකම් ඇති බව.

34. (1) ආයතනයට ආයතනයේම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල.

(2) ආයතනයේ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල වෙන් කරනු ලබන සියලු මුදල් ;

(ආ) තම බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) මුදලින් කරනු ලබන තෑගි හෝ පරිත්‍යාග :

එසේ වුව ද නිශ්චිත කාර්ය සඳහා කරන ලද ප්‍රදානවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා කරන ලද උපපාදනවලින් හෝ ලැබුණු යම් ආදායමක් ආයතනයේ ගිණුම්වල වෙන වෙනම පෙන්වා තිබිය යුතු අතර ආයතනයේ පොදු කාර්ය සඳහා හෝ පිළිවෙලින්, ඒ ප්‍රදාන හෝ උපපාදන කරනු ලැබුවේ යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒ කාර්යවලින් හෝ අරමුණුවලින් බාහිර වූ කාර්ය හෝ අරමුණු සඳහා ඒ ආදායමෙන් කිසිම ගෙවීමක් නොකළ යුතු ය :

එසේම තවදුරටත් නිශ්චිත වශයෙන්ම පර්යේෂණ කටයුතු සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබූ මුදල් වෙනම වූ "පර්යේෂණ අරමුදලක" නැන්පත් කළ හැකි ය.

(3) ආයතනයේ බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි දී, කිරීමෙහි දී හා ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ද මේ පනතින් හෝ මේ පනත යටතේ ආයතනයේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල් ද ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු ය.

35. (1) ආයතනය යම් පළාත් පාලන ආයතනයක් විසින් නියම කරන ලද යම් වරිපනම් ගෙවීමෙන් නිදහස් වන්නේ ය. වරිපනම් සහ බදුවලින් නිදහස් බව.

(2) යම් භාණ්ඩ ආනයනය කිරීම ආයතනයේ පරමාර්ථ හා අරමුණුවල වර්ධනයට හිතකර යයි සලකනු ලැබුවහොත්, ආයතනය විසින් ආනයනය කරන ලද යම් භාණ්ඩ සම්බන්ධයෙන් යම් තීරු බද්දක් ගෙවීමෙන්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින්, ආයතනය නිදහස් කළ හැකි ය.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් වටිනාකමක් දක්වා වූ සියලු පෞද්ගලික භාණ්ඩ සහ ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ ආයතනයේ මහාචාර්යවරයකු විසින් හෝ සාමාජිකයකු විසින් හෝ අධි සාමාජිකයකු විසින් හෝ ආනයනය කරන ලද සියලු වෘත්තීය උපකරණ පොත් සහ වෙනත් විද්‍යාත්මක උපකරණ තීරු බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(4) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

ආයතනයේ ගිණුම්.

36. (1) මණ්ඩලය විසින් ආයතනයේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) මණ්ඩලය විසින් එකී පොත් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින තුලනය කිරීමට සැලැස්විය යුතු අතර, එකී දිනයට සකස් කරන ලද ආයතනයේ ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුමක් ද ආයතනයේ වත්කම් හා බැරකම් පිළිබඳ සාරාංශයක් අඩංගු ශේෂ පත්‍රයක් ද ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර පිළියෙල කිරීමට සැලැස්විය යුතු ය.

(3) ආදායම් සහ වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය මණ්ඩලයේ සභාපති විසින් ද තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද මණ්ඩලයේ වෙනත් නිලධරයන් විසින් ද අත්සන් කළ යුතු ය.

(4) රාජ්‍ය සංස්ථා ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## VII වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

ස්ත්‍රී පුරුෂ භාවය, ගෝත්‍රය, වංශය, ජාතිය හෝ ආගම පිළිබඳ විෂමතා තහනම් බව.

37. කවර හෝ ගෝත්‍රයකට, වංශයකට හෝ ජාතියකට අයත්, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ සියලුම තැනැත්තන්ට ආයතනය විවෘතව තිබිය යුතු ය. තවද යම් තැනැත්තකුට ආයතනයේ අධ්‍යක්ෂවරයකු, මහාචාර්යවරයකු, සාමාජිකයකු, පර්යේෂණ අධි සාමාජිකයකු හෝ සාමාජිකයකු වශයෙන් ඇතුළුවීමට හෝ එහි යම් පත්වීමක් දැරීමට හෝ එහි යම් වාසියක් හෝ වරප්‍රසාදයක් දැරීමට, භුක්ති විඳීමට හෝ ක්‍රියාත්මක කිරීමට හිමිකම් ලැබීම සඳහා ආගමික විශ්වාසය හෝ මතය පිළිබඳ කිසිම පරීක්ෂණයක් කිරීම හෝ නියම කිරීම හෝ නොකළ යුතු ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් වගකීමෙන් නිදහස් වන බව.

**38.** (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්ය සඳහා පත් කරන ලද ආයතනයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය පිට හෝ, සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නො පැවරිය යුතු ය.

(2) ආයතනය විසින් හෝ ආයතනයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී, ආයතනයට දරන්නට සිදු වූ යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ආයතනයට ගෙවනු ලබන හෝ ආයතනය විසින් අය කර ගනු ලබන යම් ගාස්තු ආයතනයේ අරමුදල්වලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධාන මත කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් බව ඒ අධිකරණය තීරණය කළ හොත් සහ, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගනු ලැබ නොමැති නම්, ආයතනයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනයේ සාමාජිකයකුට හෝ සාමාජිකයකුගේ දේපළට හෝ විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**39.** ආයතනයට විරුද්ධව පවරනු ලබන නඩුවක දී, මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ ආයතනයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

ආයතනයේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**40.** ආයතනයේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව ද, එහි කාර්ය සඳහා ද රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව, ආයතනය, උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**41.** අල්ලස් පනතේ අර්ථානුකූලව, ආයතනය, උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ පනතේ විධිවිධාන තේරුම් ගත යුතු ය.

රීති සෑදීමේ බලය.

**42.** මණ්ඩලය විසින්, ආයතනය වෙනුවෙන්, මේ පනතින් රීති සෑදීමට නියම කරන ලද හෝ බලය පවරන ලද සියලු කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

අන්තර්කාලීන විධිවිධාන.

43. මේ පනතේ ඉහතින් වූ විධිවිධාන කුමක් වුවද, නියමිත දින යේ සිට ගණන් ගනු ලබන පළමු වර්ෂ පහ තුළ දී මණ්ඩලය විසින්—

(අ) ශාස්ත්‍රීය සභාව සංස්ථාපනය කරනු ලැබ නොතිබුණත්, ක්‍රියා කිරීම ;

(ආ) ශාස්ත්‍රීය සභාව කලින් විමසීම හෝ එහි උපදෙස් හෝ නිර්දේශ සලකා බැලීම මේ පනතේ වෙනත් විධිවිධාන යටතේ නියමිතව ඇති අවස්ථාවක, ඒ සභාව නොවිමසා සහ ඒ උපදෙස් හෝ නිර්දේශ නොසලකා ක්‍රියා කිරීම ;

(ඇ) ශාස්ත්‍රීය සභාව සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කිරීම

කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

44. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"ඉපැයීම්" යන්නෙහි, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ ඊට දී ඇති අර්ථයම තිබේ ;

"මූලික" සහ "උසස්" අධ්‍යයන යන්නට පර්යේෂණාත්මක විමර්ශන ඇතුළත් වේ ;

"විරුද්ධ පක්ෂයේ නායකයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, ඉටුකරන හා කරන බලතල, කාර්ය හා කර්තව්‍ය හා සමාන හෝ ඊට අනුරූප බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියක් මගින් හෝ ඒ යටතේ ඇති කරන ලද හෝ පිහිටුවන ලද යම් අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"නිලධරයා" යන්නට, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු, ලේකම්වරයකු, පුස්තකාලයාධිපතිවරයකු සහ මණ්ඩලය විසින් නිලධරයකු වශයෙන් පිළිගත් වෙනත් යම් තැනැත්තකු ද ඇතුළත් වන නමුදු ආශ්‍රිත අධ්‍යක්ෂවරයකු ඊට ඇතුළත් නොවේ ;

"ජනාධිපතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ ;

"අග්‍රාමාත්‍යවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයා අදහස් වේ ;

"විශ්ව විද්‍යාලය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතෙහි අර්ථානුකූල වූ විශ්ව විද්‍යාලයක් අදහස් වන නමුදු, විශ්ව විද්‍යාලයීය විද්‍යායතනයක් ඊට ඇතුළත් නොවේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.